මාධ්‍ය නිවේදනය
**PRESS RELEASE**
Sir Chittampalam A. Gardiner Mawatha, Colombo 02
+94 11 213 5400 /+94 11 213 5300 /+94 11 213 5000
cgir@ird.gov.lk

**දේශීය ආදායම් දෙපාර්තමේන්තුව**
**உள்நாட்டு இறைவரித் திணைக்களம்**
**INLAND REVENUE DEPARTMENT**

දිනය : 2024.09.27

**බදු ගෙවන්නන් වෙත කරන නිවේදනයයි**

**2023/2024 තක්සේරු වර්ෂය සඳහා අවසන් ආදායම් බදු ගෙවීම සහ හිඟබදු ගෙවා අවසන් කිරීම**

2023/2024 තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු ගෙවිය යුතු සෑම තැනැත්තෙක්ම එම තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු සියලුම ආදායම් බදු මුදල් **2024 සැප්තැම්බර් මස 30 දින හෝ එදිනට පෙර** ගෙවා අවසන් කළ යුතුය.

එසේ යම් තැනැත්තෙක් කටයුතු නොකරන්නේ නම්, නොගෙවන හෝ ප්‍රමාද වී ගෙවන ආදායම් බදු වෙනුවෙන් නීති ප්‍රකාරව දණ්ඩනයකට සහ පොලියකට යටත් වේ. මෙම දඩ හෝ පොලී අඩු කිරීමක් හෝ ඉවත් කිරීමක් සිදු කරනු නොලැබේ.

තවද, ඕනෑම බදු වර්ගයක් සඳහා යම් තැනැත්තෙකු විසින් ගෙවිය යුතු බදු මුදල් නොගෙවා සිටීමෙන් ඇති වූ "හිඟ බදු" පවතී නම්, ඒ සියල්ල **2024 ඔක්තෝම්බර් 30 දින හෝ එදිනට පෙර** ගෙවා අවසන් කළ යුතු වේ. එදිනට පසුව තවදුරටත් නොගෙවා සිටින හිඟ බදු පවතී නම්, ඒවා අය කර ගැනීමට දේශීය ආදායම් පනතේ සඳහන් පරිදි නීතිමය කටයුතු ඇතුළුව සියලුම ආකාරයේ අය ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට සිදුවනු ඇත.

ඉහත කරුණු පිළිබඳව වැඩිදුර තොරතුරු අවශ්‍ය වේ නම්, 1944 අංකය අමතා හෝ ඔබට ආසන්නම දේශීය ආදායම් ප්‍රාදේශීය කාර්යාලය සමග සම්බන්ධ වී එම විස්තර ලබා ගත හැකිය.

කොමසාරිස් ජනරාල්
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

ඩබ්.ඒ. සේපාලිකා චන්ද්‍රසේකර
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
සර් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත
කොළඹ-02.